# අපේ සුරතලුන්



## හැඳින්වීම

අපගේ සුරතල් සුනඛයා වන ටයිනිගේ ගති පැවතුම් මෙතෙක් අප සමග හැදුනු වැඩුනු අනෙකුත් සුරතලුන්ට වඩා වෙනස් බැවින් මෙසේ සටහන් කර තැබීමට සිතුනි. ඒ අනුව මා කුඩාකල සිට මේ දක්වා අප පවුලේ සාමාජිකයින් ලෙස විසූ සියළුම සුරතලුන් ගැන මට මතක ඇති කරුණු මෙසේ සටහන් කරමි.

ජයසිරි විජේරත්න
හිඹුටාන
2011 නොවැ 07

## බ්‍රවුන්

මා කුඩා කල අප සමග විසූ දුඹුරු පැහැයෙන්යුතු බ්‍රවුන් ඉතා සිත්ගන්නාසුළු සුනඛයෙකි. ඌ සමහරදාට අප සමග ඇඳේ නිදාගනී. දිනක් රාත්‍රියේ ඌ නොකඩවාම බුරන්නට වූයෙන් තාත්තා දොර ඇරගෙන මිදුලට ගියවිට ඌ බුරමින් ඉදිරියට දුවගොස් නතර විය. තාත්තාද ඌ පසුපස ගියවිට ඌ තවටිකක් දුර වත්ත පහළට ගොස් බුරන්නටවිය. තාත්තා ඌ පස්සෙන්ම ගියේය. අවසානයේ වත්ත පහළ ඇති අපේ කුඹුරට ගොස් බුරන්නටවියං එහි ගිය තාත්තාට දක්නට ලැබුනේ හරකුන් කීපදෙනෙක් කුඹුරේ ගොයම් කන බවය. හරකුන් පන්නා දැමූ තාත්තා බ්‍රවුන්ට ස්තූති කළේය.



මෙම ඡායාරූපයේ සිටින්නේ බ්‍රවුන්ය. වම් පැත්තේ මමද, මැද නංගීද, දකුණු පැත්තේ සුදුඅයියාද සිටින අතර පිටුපසින් පුංචිඅක්කා සහ පොඩිඅක්කා සිටී. ඡායාරූපය ගන්නාලද්දේ අයියා විසින් ඔහුගේ බොක්ස් කැමරාවෙනි. (1957 දී පමණ)
කලක් ගතවූ පසු බ්‍රවුන් අසනීප වී කෑම නොකා සිට මියගියේය. පුංචි අපි හැඬූ කඳුලින් යුතුව සුදු කොඩි රැගෙන පෙරහැරකින් ගොස් භූමදාන කටයුතු කරන ලදී.

## ජෝයි සහ ජිමී

ජෝයිද දුඹුරු පැහැති ලස්සන සිනාමුසු මුහුණක් හිමි, බ්‍රවුන්ට වඩා කුඩා සුරතලෙකි. දිනක් අප ගංවතුරේ ඔරුව පැද යනවිට, ජෝයි වතුරට පැන අප සිටි දෙසට පීනන්නට වූයෙන් ඔරුව ආපසු හරවා  ජෝයිවද ඔරුවට නංවාගතිමු.
ජෝයි සිටි කාලයේම ජිමී නමැති තවත් කළුම කළු සුනඛයෙක් විසුවේය. දෙදෙනා සහයෝගයෙන් කාලය ගතකලෝය. නමුත් වරක් දෙදෙනා පොරකන්නට වූයෙන් වතුර බාල්දියක් ඇඟට දැමූවිට පොරය නතර විය.

## <u>ලැසී</u>

ලැසී යනු සුදුම සුදු ලස්සන මුහුණක් සහිත බැල්ලකි. කුඩා කල විජේසිරිගේ නිවසේ උපත ලද ඇය අප ගෙනවුත් ඇති දැඩි කළෙමු. කුස්සිය පැත්තේ තබා ඇති ඌටම වෙන්කර තිබූ පිඟානට බත් බෙදා දුන්විට, පිඟාන කටින් අල්ලා උස්සාගෙන, බත්ඇටයක්වත් නොහැලෙන ලෙස ඉස්තෝප්පුවට ගෙන ගොස් කෑම උගේ සිරිතක් විය. ඌ ඉතා කීකරුය, කටේ ඇති මස්කටුවක් වුවද ආපසු ගැනීමට පුළුවන.

එකල (1990 දී පමණ) අපේ වත්තේ පිටුපස ඝන කැලෑවක් ලෙස පැවතුනි. දිනක් එම කැලෑවෙහි කුකුලෙක් මරහඬ දෙන ශබ්දයක් ඇසුනි. පසුව ගොස් බැලූවිට මා දුටුවේ ලැසී විසින් කුකුලෙක්ව මරාගෙන කා ඇතිබවය. පිටුපස ගෙදරක කුකුලන් ඇතිකරනු ලබයි. වරින්වර කුකුලන් කීපදෙනෙක් අතුරුදහන් වී ඇතිබව පසුව දැනගන්නට ලැබූ නමුත් එය ලැසීගේ වැඩක් බව හෙළි නොවීය.

ලැසීට දරු දෙදෙනෙක් විය. ඔවුනට බ්‍රවුනි සහ සින්ඩි යයි නම් තබන ලදී. බ්‍රවුනි, පොඩිඅක්කා විසින් ගෙනගොස් හදාගන්නා ලද අතර සින්ඩි අපේගෙදරම හැදුනි. වසර දහයක් පමණ ජීවත්වූ ලැසී වයස්ගතවී අවසන් හුස්ම හෙළීය.

බ්‍රවුනි අවුරුදු පහළොවක් පමණ ජීවත් විය.

## සින්ඩි

සින්ඩිගේ සියළු සත්කාර කරනලද්දේ චූටිදූව-තිළිනි විසින්ය. උගේ තිබූ විශේෂ ලක්‍ෂණයක් නම් කිසිවෙකුටත් චූටිදූවගේ කාමරයට යාමට ඉඩ නොදීමය. චතුරිකාට (ලොකු දූව) පවා එහි යාමට නොදී දොර ළඟ සිට ගොරවයි. ගෙදරට පැමිණි අමුත්තෙක් මැදසාලයේ සිට තිළිනිගේ කාමරය දෙසට හැරුනොත් වහාම තිළිනිගේ කාමරයට දුවයන සින්ඩි දොර ළඟ රැකගෙන සිටී.

දිනක් සින්ඩි අමුතු විධියකට බුරන්නට වූ බැවින් මා වහාම ගොස් බැලුවෙමි. නයෙක් ඌ ඉදිරියේ පෙනය පුප්පාගෙන සිටින අතර සින්ඩිද ටික ටික ඉදිරියට යමින් බුරන්නට විය. මා සැරකර කීපවරක් අඬගැසූවිට මාළඟට ආවේය. ඉන්පසු නයා පෙනය හකුලාගෙන ඉවතට ඇදුනි.




*සින්ඩි කුඩා අවදියේදී*



*සින්ඩි සෑමවිටකම නිදාගත්තේ මෙම පුටුව මතය. එම පුටුව වෙන තැනකින් තැබුවත් ඌ ඊට රැවටෙන්නේ නැත.*



<u>සින්ඩිගේ අභාවය</u>

වසර හතක් පමණ ජීවත්වූ ඇය අසාධ්‍ය ලෙස රෝගාතුරවූවිට පශු වෛද්‍යවරයා කීවේ ලේ දුන්නොත් සමහරවිට බේරාගතහැකි බවයි. ඒ අනුව තම සහෝදරයා වූ බ්‍රවුනිගෙන් ලේ දෙන ලදී. නමුත් සතියක් පමණ ආහාර නොගෙන සිට අවසන් හුස්ම හෙලීය.




2005 ජුලි 10 වැනිදා දහවල් 1.40 ට පමණ ඉස්තෝප්පුවේ සිටි සින්ඩි ඉතා අපහසුවෙන් බිම වැටෙනු දුටු මම වහා ගොස්, හිස අතමත තබාගෙන අතගාන්නට වුයෙමි. මගේ මුහුණ දෙස බලා සිටිමින්ම දිව පහළට කඩා හැලුනි. ඒ ඇගේ අවසන් මොහොත විය.

සින්ඩිගේ සිරුර භූමදාන කළ ස්ථානයේ චූටිදුව විසින් වතුසුද්ද අත්තක් සිටුවන ලදී. එය අද ඉතා හොඳින් වැඩී ඇත.



සින්ඩිගේ අභාවයෙන් සත් දිනකට පසු
හිඹුටාන උපාසිකාරාමයේ සිල් මෑණිවරුන් වැඩම කොට
දානයක් දී පින් අනුමෝදම් කරන ලදී.

## පූස් පැටියා

එක් උදෑසනක පූස් පැටියෙක් කෑගසන හඬක් ඇසී බැලූවිට කුඩා පූස්පැටව් දෙන්නෙක් අපේ වත්තේ තාප්පය ළඟ සිටිනු දක්නට ලැබුනි. සතියකට වඩා වයසක් නැති උන්ට එවේලේම කිරි ටිකක් බීමට දුන්නෙමු. ඉන් එකෙක් ඉතා දුර්වල තත්වයක සිටි අතර දින දෙකනට පසු මියගියේය. අනෙකා චූටිදූව විසින් ආදරයෙන් ඇතිදැඩි කළාය. මාසයකට පමණ පසු ඌ අතුරුදහන් විය. සෑමතැනකම සෙවූ නමුත් කිසිම හෝඩුවාවක් නොලැබුනි. අවට පාරවල් දිගේ ගොස් සොයා බැලුවෙමු. අසල්වැසියන්ගෙන් විපරම්කර බැලුවෙමු. පසුව චූටිදූවගේ ඉල්ලීම පරිදි උගේ ඡායාරූපයක් ඇතුලත් දැන්වීමක් පිළියෙලකර අවට ලයිට් කනුවල සවිකළෙමු. නමුත් කිසිම ආරංචියක් නොලැබිනි.





මෙම පූස් පැටියා අතුරුදන්වී මාස කීපයකට පසු දිනක පෙර මෙන්ම උදේ තාප්පය ලඟ පූස් පැටියෙක් කෑගසන හඬක් ඇසුනෙන් එහි ගොස් බැලූවිට තවත් එවැනිම පූස් පැටියෙක් සිටිනු දක්නට ලැබුනි.





## දෙවැනි පූසා

ඌවද චූටි දුව විසින් ඇතිදැඩි කළාය. ඌ සමහර වෙලාවට ටයිනි සමග සෙල්ලම් කිරීමට පෙලඹුනත් ටයිනි එතරම් කැමැත්තක් නොදක්වයි. ඌ සතුන් දඩයම් කිරීමට දක්ෂයෙකි. කුරුල්ලන් සහ ලේනුන් කීපදෙනෙක්ම ඌට බිලිවිය.

බොහෝ දිනවල රාත්‍රියේ ඌ සිටින්නේ වහලෙ උඩය. උදේට කිරි සාදා අඩගහනවිට බොහෝවිට ජම්බෝල ගහ දිගේ  වහලයෙන් බැස පැමිණෙයි.

## තුන්වැනි පූසා

වර්ෂ 2011 නොවැම්බර් මැදදී දිනක් උදෑසන බළල් පැටියෙකුගේ හඬක් ඇසුනෙන් ඒ ගැන සොයා බැලූවිට දක්නට ලැබුනේ පෙර පරිදිම තාප්පයට උඩින් වත්තට දමා ඇති බළල් පැටියෙකි. මා ළඟට ගියවිට ඌ කැලෑව අස්සට රිංගාගත් බැවින් කිරි ටිකක් පොල්කටුවකට දමා තැබූවිට ආපසු පැමිණියාය. ඌව කොහේ හරි ගිහින් දාමු යයි මා යෝජනා කලත් චූටිදූව-තිලිනි ඊට විරුද්ධ වූයෙන් ගෙදරට ගෙන ඇතිදැඩි කළෙමු. නමුත් ගෙදර සිටින ලොකු බළලාගෙන් ඌට ප්‍රහාර එල්ලවීම ලොකු ප්‍රශ්ණයක් විය. දිනක් රාත්‍රී 10 ට පමණ ලොකුපූසා විසින් බරපතල ලෙස තුවාල සිදුකරන ලදී. රාත්‍රියේම සත්ව රෝහලකට ගෙනගොස් ප්‍රතිකාර කරන ලදි. තුවාලයට මැහුම් 10 ක් පමණ දමා තිබුනි. ඌව ලොකුපූසගෙන් බේරාගැණීම විශාල ප්‍රශ්ණයක් විය. තුවාලය සුවවූපසු දිනක් (2012 ජන-10) කිසිවෙකුටත් නොකියාම ගෙනගොස් ගල්වාන පුරාන විහාරස්ථානය අසල අතහැර ආවෙමි. එදින චූටිදූව බොහොම හිතේ අමාරුවෙන් සිටි අතර මටද මුළු රාත්‍රියේම නින්දක් නොලැබින. පසුදින උදෑසනම ගොස් ආපසු ගෙනාවෙමි. ඉන්පසු දෙවරක්ම ලොකු පූසගේ ප්‍රහාරයට ලක්විය. එක්වරක මා අසල සිටි බැවින් ඌව බේරාගතහැකිවිය. අනෙක් අවස්ථාවේ ටයිනි මැදට පැනීම නිසා එය වැලකුනි.

සෑමවිටම හමුවන සෑමදෙයක්ම ඉතා විමසිල්ලෙන් සොයා බැලීම උගේ කැපීපෙනෙන ලක්‍ෂණයක් විය. කෑම දෙනවිට ඌට පළමුව දී ඊළඟට ටයිනිට දුන්විට වහාම ඌ ටයිනිගේ කෑම පිඟාන වෙත දුව යයි. දෙදෙනාම එකට සහයෝගයෙන් කෑම ගනී. ටයිනි සමග නිතරම සෙල්ලම් කිරීමට උත්සාහ කළත් ටයිනි ඊට කැමැත්තක් නොදක්වයි. ටයිනිගේ කණට අතින් ගසයි නැතහොත් වලිගයේ එල්ලෙයි. එවිට ටයිනි වෙන තැනකට දුවයයි, කිසිවිටකත් සැරවැර නොකරයි. හවස්කාලයේ මා නිදාගත්විට ඌ මගේ ඇඟඋඩටවී නිදාගනී.







මාස තුනක් පමණ වයසැති ඌ දැන් ටිකක් ලොකුයි නිතරම ගස් උඩට නගී. අද ඌ වහලයට නැමී ඇති ජම්බෝල ගහ දිගේ ගොස් වහලෙ උඩට නැග්ගේය. සමහරදාට සපතිල්ල ගහ මුදුනටම (මීටර 7 ක් පමණ) නගී.

2012 මාර්තු 3 :- මාස තුනහමාරක් පමණ අප හා විසූ ඌ අද අපෙන් සමුගෙන පුතාගේ මිතුරෙකුගේ නිවසට ගියාය. ඌව ප්ලාස්ටික් කූඩයකට දමා මෝටර්රියතුලට ගන්නාවිට ටයිනි ඉතා උනන්දුවෙන් බලාසිට මා දෙස විශ්මයාන්විතව බැලුවේ, පූස්පැටියව ගෙනියන්නේ කොහේද? යයි අසන්නාක්මෙනි. එය දුටු මගේ දෙනෙතට කඳුලු පිරුනි.

## ටයිනි

සින්ඩිගේ අභාවයෙන් මාස ගණනකට පසු දිනක් (2006 මාර්තු) අපේ ගේ පිටුපස, කාන්ති සහ රනඩෝල්ෆ්ගේ ගෙදරට ගියවිට එහි බලුපැටවුන් කීපදෙනෙක් සිටිනු දැක, මම එකෙක්ව ඉල්ලුවෙමි. ඒ සමගම ඉන් එකෙක් වලිගය වනමින් මා ළඟට ආ බැවින් ඌව රැගෙන ආවෙමි. කළුම කළු උගේ හොම්බ වටේටද, පා සතරේම පහළ කොටසද, බෙල්ල යට පමණක් සුදු පාටය. (සින්ඩිගේද ඒ අයුරුම සුදු පාටින් යුක්ත විය) ඌට "ටයිනි" යයි නම් තබන ලදී. උගේ සහෝදරයෙක් පුංචි අක්කල ගෙනගොස් හදාවඩා ගන්නාලදී. ඌට ස්කූබී යනුවෙන් නම් තැබීය. දෙදෙනාම බොහෝ දුරට එක සමානය.



*ටයිනිව ගෙනා දිනයේ ගත් ඡායාරූපයක්*

දිනක් කාන්තිගේ දරුවන් සෙල්ලම්කරන හඬක් ඇසී ඒ හඬ ඔස්සේ කැලෑව තුලින් රිංගා ඌ උපන් ගෙදරට ගිය ටයිනි නිතරම එහි යාම පුරුද්දක් කරගත්තේය. බොහෝවිට ඔවුන් පාසැල ඇරී ගෙදර එන වෙලාවට එහි යාම සිරිතක් විය.

පසු කලෙක අපේ වත්ත පිටුපස කම්බිදැලක් සවිකරනලද නමුත් තැනතැන දැල යටින් රිංගා යන්නට විය. පසුව මා ලොකු කළුගල් තබා පස්දමා ආවරනය කලවිට, පස් ඉවත් කර පොළව හාරා පාර හදාගෙන තිබුනි. එම මගද ආවරනය කළවිට, දැල කටින් ඇද කඩා සිදුරක් හදාගන්නා ලදී. ඉන්පසු මම ඊට බාධා නොකළෙමි. තවමත් සැමදිනකම එතනින් රිංගා යයි. එලෙස පිටුපසින් රිංගා

ගොස් ඉස්සරහ ගේට්ටුව ලඟට පැමිණ එක වරක් “බුෘ” කියා මිනිත්තුවක් පමණ නිහඬව බලා සිටී. කිසිවෙක් ගේට්ටුව ඇරීමට ආවේ නැත්නම් නැවතත් එසේ කරයි.



*ටික කලකට පසු*



*ටයිනි නිතරම සෙල්ලමට කැමතිය. ප්ලාස්ටික් බෝතලයකින් සෙල්ලම් කරන අයුරු.*



දැලට යටින් පොළව හාරාගෙන ගිය අන්දම

අප අතර විසූ සුනඛයන් අතුරෙන් ටයිනි ඉතාමත් බුද්ධිමත් බව උගේ බොහෝ ක්‍රියාවන්ගෙන් පැහැදිලිවෙයි. දිනක් මා ගෙට ගොඩවන විට දොරලඟ තිබූ පාපිස්ස නැතිබව දැක "කවුද මේ පාපිස්ස ගත්තෙ" යනුවෙන් කාටත් ඇසෙන ලෙස කීවෙමි. ඒඅසල සිටි ටයිනි වහාම ගේට්ටුව ළඟට දුවගොස් පාපිස්ස උස්සාගෙන ආවේය. සමහර දිනවල මා පොඩිඅක්කලගෙ ගෙදරට යන බව ගෙදර සිටින කෙනෙකුට කියා එහි ගිය විටම ටයිනි පිටුපස වැටෙන් රිංගා එහි පැමිණේ. දිනක් කුසුම්, තිලිනි අමතා "මම වෛද්‍යාසේකර ඇන්ටිලගෙ ගෙදරට යනව" යයි කියනවිට ටයිනි එය අසා සිටි අතර, එහි ගොස් සුළු වෙලාවකින් එතැනට පැමිණ ඇත. (එම නිවස, අප නිවසේ සිට මීටර 100 ක් පමණ දුරිනි පිහිටා තිබුනි.)

මම දවසක් නංගිලගෙ ගෙදර (කි.මී. බාගයක් පමණ දුර) යනබව කියා කාර් එකින් එහි ගොස් ටික වේලාවකින් ටයිනි එහි පැමිණ කාර් එකට නැගී ආපසු ආවේය.

මා දිනක් ඉනිමගට නැග කැඩුන හෝල්ඩරයක් ගලවා බිම දමා අළුත් එකක් සවිකළෙමි. බිමට බැස, බිමදැමූ හෝල්ඩරය සෙවූ නමුත් එය සොයාගත නොහැකි විය. ටයිනි ඒ අසල සිටි බැවින්, "මම බිම දාපු එක ඔයා එහෙම ගත්තද?" යනුවෙන් ටයිනිගෙන් ඇසුවෙමි. ඌ සැනෙකින් ගේට්ටුව ළඟට දුවගොස් එය රැගෙන ආවේය.

මා දිනක් මගේ ආධුනික ගුවන්විදුලි ඇන්ටෙනාවන් සවිකර ඇති ඇන්ටෙනා කනුවට නැංගෙමි. ටයින් කෙඳිරිගාමින් වරින් වර උඩ බලමින් එතනටවී සිටියේය. මම පැයක් පමණ එය මත මගේ කාර්යයෙහි නිරතවී සිටි අතර, මා බිමට බසිනතුරුම, ඉවතට නොගොස් බලා සිටියේය.

මා මෝටර් රථයෙන් ගිය කිපවරක්ම එය පිටුපසින් දුවගෙන එන බැවින් නැවතී ඌවත් නංවාගෙන ආපසු ගෙදට ඒමට සිදුවී ඇත. දිනක් මා ගමණක් ගොස් ගෙදර එන අතර, නිවසට මීටර 100 ක් පමණ ඇතින් කාර් එක නවතා එහි ගොඩනැගිල්ලක උඩ තට්ටුවේ ඇති පොත් සාප්පුවට ගියෙමි. ඒ අවට අතුරු පාරක් දිගේ ටයිනි එන බව දුටු මම ඒ දෙස බලා සිටියෙමි. පාරට පැමිණි විට හදිසියේම නවතා තිබූ කාර්එක දැක වටේටම ගොස් වීදුරු වලින් එබී බලා ඇතුලේ කවුරුත් නැතිබව දැක, මා එනතුරු එතැන ඉඳගෙන බලා සිටියේය. ඌ කාර් එකේ යාමට ඉතා ආශාකරයි.

කාර්එක ඇතුලට ගියොත් ඉන් පිටතට ගැණීම ඉතා අපහසුය. දිනක් හිතවතෙකුගේ කාර්එකකින් ගමනක් යාමට මා පිටත්වූවිට රබර්මෝල හන්දිය තෙක් (මීටර් 700 ක් පමණ) පිටුපසින් දුවගෙන ආ බැවින් නතරවී ටයිනිවත් නංවාගෙන ආපසු ආවෙමි.



*මිදුල අතුගාපු කොළ රොඩු ගොඩක් අස්සෙ හැංගිමුත්තං කරනව වගෙයි.*

ටයිනි සැමදාම වාගේ උදේට තම සොහොයුරු ස්කූබී සමග රවුමක් යාමට අමතක නොකරයි. පැය බාගයක් පමණ දෙදෙනාම එක්ව පාරෙ එහා මෙහා ගොස් ආපසු පැමිණේ. උදේට අප සියළු දෙනාටම නොයෙක් වැඩ ඇතිනිසා දිනක් උදේ ගේට්ටුව ලඟ කීපවරක් බුඃ කියනවිට මම එහිගොස්, ”උදේට ගේට්ටුව අරින්න එන්න බැහැ, මීට පස්සෙ උදේට ඔයා වැටෙන් රිංගල එන්න.” යනුවෙන් කීවෙමි. ඉන්පසු සැමදිනකම උදේට වැටෙන් රිංගා පැමිණේ. පැමිණී වහාම පළමුව මාලඟට පැමිණ ඒබව කීමටමෙන් මගෙ ඇඟට පනී. නැතහොත් කකුල ලෙවකයි.

දිනපතාම උදේ කිරි සාදා දෙන්නේ මා විසිනි. කිරිටික උගේ කෝප්පයට දමා, අඬගසා බොන්න කියනතුරු ඇතටවී බලා සිටී. සමහරදාට ටයිනි කිරි බොනවිට පූසා පැමිණ ඊට කට ළංකරයි, එවිට ඌ අයින්වී පූසට බීමට ඉඩදී බලාසිටී. උදේට සැමදාම කුඩා රෝස් පාන් ගෙඩියක් දෙන නමුත් එය නිකම්ම කන්නේ නැත. මයික්‍රොවේව් අවන් එකට දමා තවත් රෝස්කර දියයුතුය. කර කරගා හැපෙනවා නම් පමණයි කන්නෙ. බිස්කට් එකක් දුන්නොත් එය රැගෙන පාපිස්සක් උඩට හෝ ඌ නිදාගන්නා මෙට්ටය වෙත ගොස් එය අනුභව කරයි. දවල්ට කුසුම් විසින් බත් අනා උගේ පිඟානට බෙදා අඬගැසූවිට පළමුව ඇගේ අත හෝ කකුල ලෙවකෑමට පටන්ගනී. බත්ටික කන්නේ ඊට පසුවය.



*දැන් ටිකක් ලොකු වෙලා ක්‍රිකට් ගහන්න වගෙයි ලෑස්තිය.*



*ජල නලයක් සවිකිරීමට කැපූ අගලක් තුලට වී*

දිනක් රෑ 12ට පමණ මා ගේට්ටුව වැසීමට ගියවිට ඌ පිටතට පැනගොස් පාර අයිනටවී සිටියේය. පැය බාගයකට පමණ පසු එහි ගොස් අඬගැසූ නමුත් ආවේ නැත. මා කෝටුවක් ගෙන අනුකම්පා නොකර ඉතා දැඩිලෙස රිදෙන්න පහර දෙමින් ඇදගෙන ආවෙමි. කොපමන රිදුනත් ගොරවමින් කන්න පැනීම හැර යන්තමින්වත් කෙඳිරිගෑවේ නැත. කිසිවිටකත් ඌ කාටවත් යටත් නොවන බව මට ඉන් පැහැදිලි විය.  මෙම සිද්ධියෙන් පසු මාස තුනක් පමණ ගතවනතුරු මගේ කාමරයට පැමිණියේ නැත. ඊට පෙර සැමවිටකම ඌ සිටියේ මගේ කාමරයේය. ඉන්පසු කෝටුව යන වචනයට පවා බියක් දක්වයි.

දැන් සැමවිටම වාගේ ඌ සිටින්නේ මගේ කාමරයේය. නිදාගැණීමට කුඩා මෙට්ටයක්ද මගේ මේසය ළඟ ඇත. මා පිටතට ගියොත් සුළු වේලාවකින් පැමිණ මා සිටින්නේ කොහිදැයි සොයා බලයි.

සමහර වෙලාවට මා කාමරයේ නැතිවිට මගේ ඇඳ උඩ නිදාගනී. බහින්න කී විට ගොරවයි. එවිට මා "කෝටුව ගේන්නද" කීවිට වහාම බිමට බසී. සමහරදාට සාලයේ පුටුවක් මත නිදාගනී. මා ඊට බාධා නොකරන බවත් කුසුම් දුටුවොත් සැර කරන බව ඌ හොඳින් දනී. උදේ පාන්දර මා නැගිට කුස්සියට යනවිට හිස ඔසවා බලයි. නමුත් කුසුම් ඇගේ කාමරයේ දොර අරිනවිටම ඌ ක්ෂණිකව පුටුවෙන් බැස තද නින්දේ පසුවන ලෙස බිම නිදාගනී.

උගේ තවත් අමුතුම ලක්ෂණයක් ඇත. ඌ මගේ කාමරයේ නිදා සිටිනවිට පුතා ආවොත් ගොරවයි. නමුත් චූටිදුව ආවට ගොරවන්නේ නැත. සමහර වෙලාවට කුසුම් පැමිණිවිටද ගොරවයි. පුතාගේ කාමරයේ නිදා සිටිනවිට මා එහි ගියොත් මට ගොරවයි. කුසුම්ගේ කාමරයේ සිටිනවිට කවුරු එහි ගියත් ගොරවයි.

තවත් විශේෂ ලක්ෂණයක් නම් නෑමට ඇති අකමැත්තයි. සමහර වෙලාවට "බල්ලව නාවන්න" යයි කුසුම් කියයි, එවිට මොහොතක්වත් පමානොවී එළියට පනී. ඕනෑම අවස්ථාවක නාවන්න ඕනෑ යයි සිතමින් ඌ දෙස බැලුවහොත් ක්ෂණිකව නැගිට එක්කෝ ඇඳක් යටට රිංගයි, නැතහොත් ගෙයින් එළියට පනී. **පරචිත්ත විජානන ඥාණය** ඇත්දැයි මට සිතෙයි. මෙය වරක් දෙවරක් නොව සැමවිටකම සිදුවන්නකි. ඇඳ යටට රිංගුවොත් කෙසේවත් එළියට ගතනොහැක. එළියට ගියහොත් පිටුපස වැටෙන් රිංගා රවුමක් ගොස් ටික වෙලාවකින් ගේට්ටුව ලඟට පැමිණ "බූඃ" කියයි. ඒ බව මා දන්නා නිසා කල්ඇතිවම දම්වැව ගෙනගොස් ගේට්ටුව ලඟ තබා ගේට්ටුව අරිනගමන්ම අල්ලා ගැටගසා ගනු ලැබේ. කීපවරක් මේ අයුරු නෑවීමට අල්ලාගත් නමුත් පසුව එසේ කළ නොහැකි විය. ඌ රැවටීම ඉතා අපහසුය. දැන් එසේ කළවිට ගේට්ටුවෙන් නොපැමිණ වැටෙන් රිංගා පැමිණ හොරෙන්ම ගෙට ඇතුල්වී ඇඳක් යටට රිංගයි. නෑවීම සඳහා ඉස්තෝප්පුවේ ඇතිදම්වැල කොතරම් සෙමින් අතට ගත්තත් ඒබව ඌට දැනී වහාම එළියට පනී. මෙය වරක් දෙවරක් නොව සැමවිටකම සිදුවන්නකි. ඉස්තෝප්පුවේ තිබෙන පුටුවක මා වාඩිවුවහොත් ඕනෑම වෙලාවක ලඟට පැමිණ මගේ දෙපාමුල වැතිරෙයි. දින දෙකතුනක්ම නෑවීමට අල්ලාගත නොහැකිවූ නිසා මම ඉස්තෝප්පුවේ ඇති පුටුවක වාඩිවුනේ එතැනට පැමිණිවිට අල්ලා ගැණිම සඳහාය. නමුත් ඒඅසලට පැමිණ මොහොතක් මාදෙස බලා පිටතට දුවගොස් ආපසු ආවේ පැයබාගයකට පමණ පසුවය. මාදෙස බලන බැල්මෙන්ම මා සිතනදේ ඌ වටහාගත්බව පැහැදිලිවම පෙනෙයි. නාවනවිට කිසිම කරදරයක් නොකරන අතර නෑවීමෙන් පසු ඇඟ පිසදමා, "ගිහින් අව්ව තපින්න" යයි කීවිට අව්වට ගොස් බිම පෙරලෙමින් ඉතා සතුටින් එහෙ මෙහෙ දුවයි.

<u>හොරෙකුට දැක්වූ ප්‍රතිචාරය</u>

දිනක් සවස පහට පමණ මා මගේ කාමරයේ වැඩක් කරමින් සිටින අතර මේසයට හිස තබාගෙන නින්දට වැටුනි. ටයිනිද ඒ අසලම නිදා සිටියේය. තදින්ම නින්දට වැටී සිටි ඌ හදිසියේම අවදිවී කිසි දිනක නොහැසිරුනු ආකාරයෙන් ඉතා තදින් බුරාගෙන චූටිදුවගේ කාමරයට දිවුවේය. මමද සැනෙකින් ඌ පස්සෙන් ගියවිට චූටිදුවගේ කාමරයේ දොර අඩක් විවෘතව තිබූ බැවින් ඒතුලට ගියෙමි. දොරට මුවාවී කිසිවෙක් සිටි අතර ඔහු රුවිර (නංගිගෙ පුතා) ලෙස හඳුනාගත් මා රුවිර මොකද මෙහෙ යනුවෙන් විමසුවෙමි. මා හඳුනන කෙනෙක් බව අවබෝධ කරගත් ටයිනි සැනෙකින් බිරීම නවතා ආපසු හැරී මගේ කාමරයටම ගිය අතර රුවිරද, ඌ පස්සෙන්ම ගෙයි මැදසාලය දෙසට ගියේය. මේ අතර චූටිදුවගේ අල්මාරිය විවෘතව තිබූ අතර එහි ලාච්චුව ඇඳ මත ඇති බව දුටු මා, ඒ රුවිර නොව හොරෙක් බව සැනෙකින් වටහා ගතිමි. මා වහාම පිටතට දුවගොස් සෙවූ නමුත් පෙනෙනතෙක්මානයේ කිසිවෙක් සිටියේ නැත.

අමුත්තෙක් ගේට්ටුව අසලට පැමිණි වහාම බුරන ටයිනි, අප කිසිවෙක් අමුත්තා සමග කථාකළ වහාම නිශ්ශබ්ද වෙයි.

<u>මා අනූනමයෙන් බේරීම</u>

2013 මැයි 3 දින දහවල් 12.45 ට පමණ මා තනිව නිවසේ සිටියදී නිවසට ඉහළින් අකුණක් පිපිරුනි. මා අනතුරකින් බේරුනේ "ටයිනි" නිසා යයි කීම අතිශයෝක්තියක් නොවේ.

මම හාන්සි පුටුවේ වාඩිවී දිවා ආහාරය ගන්නාවිට සුපුරුදු පරිදි ටයිනි පැමිණ මගේ දෙපා අතර සරම මත නිදාගත්තේය. මා ආහාර ගෙන අවසන් වූ පසු ටයිනිට නැගිටින්න නොකීවේ, එය උගේ ප්‍රියතම අසුන වන නිසාය. මිනිත්තුවක් පමණ ගතවූවිට කිසි දිනක නොඇසුන මහ හෙන හඬක් නංවමින් අකුනක් පිපිරුනි. මා ටයිනිව නැගිට්ටුවා පිඟාන සේදීමට ගියේ නම් අනතුරක් සිදුවනු නොඅනුමානයි, ඒ මන්දයත් kitchen sink එක අසලම සවිකර තිබූ floor tile එකකින් කැබැල්ලක් (ග්‍රෑම් 200ක පමණ) පිපිරී ඉවතට විසිවී තිබුනි. ඊට අමතරව විදුලි උපකරණ ගණනාවකටම හානි පැමිණුනි. මා පිඟාන සේදීමට ගියේ නම් එම ෆ්ලෝටයිල් කැබැල්ල මගේ ඇඟේ වදිනු නොඅනුමානයි.



ටයිනිගේ ප්‍රියතම අසුන



දැන් ටයිනිගෙ වයස අවුරුදු දහයක් පමණ වේ.

## තමා දන්න බව ඇඟවීම

සමහර අවස්ථාවල ටයිනි කරන වැඩවලින් පැහැදිලි වන කරුණක් නම් ඌ දන්නබව අපට ඇඟවීමට එය සිදුකරන බවය.

උදාහරණ ලෙස මම ගෙදරින් පිටවීම සඳහා ඇඳුමක් අඳිනවිට, මගේ කාමරයතුල තිබෙන උගේ මෙට්ටය මත නිදාසිටින ඌ වහාම නැගිට කාමරයෙන් පිටතට යයි. මා පිටත යනවිට කාමරයේ දොර වහනබව ඌ දන්නාබව ඇඟවීමට එසේ කරයි.

තවත් උදාහරණයක් නම්, සෑම දිනකම වාගේ උදේට චූටි දුවගේ සහ පුතාගේ ඇඳුම් ඉස්ත්‍රික් කරනු ලබන්නේ මා විසිනි. එම ඇඳුම්, මා විසින් අතට ගත් වහාම ඒ දෙස බලාසිටින ටයිනි වහා දුවගොස්, ඇඳුම් මදින  කාමරය තුලට වී මා එනතෙක් බලා සිටියි, නැතහොත් එහි නිදා ගනියි.

## ටයිනිගේ වැසිකිලිය

ටයිනි මලපහ කිරීමට යන්නේ සෑමවිටකම අපේ වත්තේ පිටුපස මුල්ලකටය. සාමාන්‍යයෙන් කවුරුත් එම පෙදෙසට යන්නේ නැත. අප කිසිවෙක් ඒ දෙස බලාසිටින බව දුටුවොත්, තම ක්‍රියාව නවතා එහා මෙහා ඇවිදිමින් සිටී.

2018 අගෝස්තු මැද භාගයේ තදබල ලෙස අසණීපවූ ටයිනි, දින දහයක් පමණ ආහාර නොගත් බැවින් ඉතා දුර්වල විය. ඇවිදීම පවා ඉතා අපහසු වුවත් මලපහ කිරීම සඳහා වත්ත පිටුපස දෙසටම ගියේය.

## ටයිනිගේ අභාවය

මාසයක පමණ සිට ක්‍රමයෙන් ආහාර ගැනිම අඩුකළ ටයිනිට වෛද්‍ය ප්‍රතිකාර දුන් අතර දින දහයක් පමණ කිසිම ආහාරයක් ගත්තේ නැත. රුධිර පරීක්ෂණ වාර්තාව අනුව වකුගඩු අක්‍රිය බව වෛද්‍ය මතය විය. පසුගිය දින පහක් පමණ ජීවත් වූයේ සේලයින් වලිනි. අද 2018 අගෝස්තු 31වැනිදා රාත්‍රි 8.40ට පමණ ටයිනිගේ අභාවය සිදුවිය. තිරිසන් ආත්මයෙන් මිදී සුගතිගාමී වේවා යනු අප කාගේත් පැතුම විය. (වසර12½ ක් පමණ ආයු වින්දනය කළේය)

## නූරි



.

2017 මුල් භාගයේ කළු බැල්ලක් අපේ මිදුලේ සිටිනු දක්නට ලැබුනෙන් එලවා දැමීමි. කීප විටක්ම එලවාදැමූ නමුත් නැවත නැවතත් ආපසු පැමිණි බැවින්ද, ටයිනි ඌව සුහදව පිළිගන්නා බැවින්ද, කෑමට යමක් දුනිමු. ටික දිනකට පසුව ඌ ස්ථිරවම අප නිවසේ ඉස්තෝප්පුවේ පදිංචි විය. ඌ නමින් **නූපි** බවත්, අපගේ අසල්වැසි නිවසක ඇතිකරන බැල්ලක් බවත් පසුව දැනගන්නට ලැබුනි. දින කීපයකට වරක් එහි ගොස් ආපසු ඒම උගේ සිරිත විය.

කලක් ගතවූ පසු ඌ අපට ඉතා හිතවත් වූ අතර, ඉතාමත් කීකරු විය. බොහෝ දිනවල රාත්‍රියේද නිවස තුලම නිදාගන්නට පුරුදු විය. අප කිසිවෙක් ඌ දෙස බැලුවහොත් වලිගය වනයි. වෛද්‍යවරයා විසින් ඉන්ජෙක්ෂන් එකක් විදිනවිට පවා වලිගය වනන්නට විය.

2020 මැද භාගයේ තරමක් අසාධ්‍ය තත්වයකට අසණීප වූ බැවින් වෛද්‍ය ප්‍රතිකාර කිරීමට සිදුවිය. බරව විශබීජය රුධිරයේ ඉතා අධික ප්‍රමාණයකින් පවතින බවත් වකුගඩු දුර්වල බවත් රුධිර පරීක්ෂණ වලින් හෙලිවිය. දින පහක් පමණ සේලයින් දුන් අතර 2020 අගෝස්තු 6 වැනිදා සවස 2.45ට අවසන් ගමන් ගියාය.

## <u>දෙවැනි නූපි</u>

2020 දෙසැම්බර්-4

අද දහවල් කොස්වත්ත service station එක අසල කුඩා බලු පැටව් දෙන්නෙක් සිටින බවත් ඉන් එකෙක් මට ගෙනත් දෙන්නද යයි නදීක (4S6NCH) විසින් විමසූ බැවින් මම ඊට එකඟ වීමි. උන් දෙදෙනාම කළුතෙල් වලින් අපවිත්‍ර වී සිටි බැවින්, උණු වතුරෙන් නාවා පිස්සුබලු රෝගය සඳහා බෙහෙත් විදීමෙන් පසු ඉන් එකෙක්ව අප නිවසටම ගෙනත් දෙන ලදී.

ගැහැණු සතෙක් වූ ඌටද නූපි යනුවෙන් නම් තබන ලදී.

ඌ සෙල්ලමට ඉතා කැමතිය. නිවසට පැමිණෙන සෑම කෙනෙක් සමගම සෙල්ලම් කිරීම උගේ සිරිතකි. බොහෝ දිනවල මිදුලේ ඇති ජලතටාකයට පනී. ඌ සොබාදහමට ඇලුම් කිරීම විශේෂත්වයකි. කුරුල්ලන් ඉගිලෙනවිට බොහෝ වේලා බලා සිටියි. සමනළයින් පසුපස දුව යයි. ගස් උඩ සිටින වඳුරන් දෙස බලමින් විශාල සතුටක් ලබයි. දිනක් පැටවෙක් ප්‍රසූතකිරීමේ අපහසුතාවයකින් බිම සිටි වැදිරියක් අසල බොහෝ වේලාවක් රැඳී සිටි අතර උගේ පිට ලෙවකන්නට විය. ඌට හිරිහැර නොකළේය.

සොබාදහම රස විඳින සතෙක් ගැන මා මීට පෙර අසා නැත. පළමු වරට වැස්සක් දුටුවිට ඉතා ඕනෑ කමින් මිදුලට ගොස් වරින්වර උඩ බලමින් සතුටු විය. ඉන් පසුව වුවත් වහින වෙලාවට තෙමිතෙමී දුවමින් ලොකු වින්දනයක් ලබයි. අහස ගෙරවීම සහ විදුලි කෙටීම මුල්වරට අත්විඳි

අවස්ථාවේ තරමක බියක් ඇතිවූවත් ගෙයින් පිටතට ගොස් එය නිරීක්ෂණය කරමින් ලොකු සතුටක් ලැබීය.

සෑම දිනකම වාගේ උදේ 5.30 ට පමණ මගේ ඇඳට පැන මාව අවදි කරන අතර සමහර දින වල ඇඳ මත නිදා ගනී.



සති කීපයක් වයසැතිව, අපට ලැබුන දවසේ



සති කීපයකට පසු

අවුරුද්දක් පමණ වයස ගියවිට සෑම දිනකම මගේ ඇඳේ නිදයි. බොහෝවිට මා ඇඳට නගිනතුරු බලා සිට, මා ඇඳට නැගී විගසම ඇඳට ගොඩවී මගේ දෙපා අසළ නිදයි. මගේ ඇඟේ ගෑවෙමින් සිටීමට ඌ ප්‍රිය කරයි. මේ හේතුව නිසා අඩු වශයෙන් දින තුනකට වරක්වත් නාවනු ලැබේ.

පසු කලෙක ඇඳේ නිදාගැනීමේ පුරුද්ද, ඉතා අපහසුවෙන් නතර කරවූයෙමි.



දැන් අවුරුද්දක් පමණ වයස ඇති

බොහෝදින වල අපේ වත්තට ඉත්තෑවන් දෙතුන්දෙනෙක් පැමිණේ. මැදියම් රැයේදී පැමිණෙන ඉත්තෑවන් ආපසු යන්නේ අළුයම් කාලයේදීය. ඉත්තෑවන් පසුපස එලවායන අතර දෙවරක්ම ඉත්තෑකූරු ඇනගෙන මරහඬ දෙමින් නිවසට දුවගෙන ආවේය. එක් දිනක උදෑසන හයට පමණ එලෙස දුවගෙන එන අවස්ථාවක් අපගේ CCTV කැමරාවක සටහන් වූ ආකාරය පහත Link එකින් දැකබලාගත හැකිය.

VID-20211014-WA0
001.mp4

මේ තරම් සතුටින් ඉන්න කෙනෙක් මේ අහලකවත් නෑ කිව්වොත් එය අතිශයෝක්තියක් නොවේ. මුළු දවස පුරාම වත්තපුරාම දුවනව. බොහෝවිට උඩ බලාගෙන වඳුරෝ පස්සෙන්, ලේන්නු පස්සෙන්, කුරුල්ලො පස්සෙන්, සමනල්ලු පස්සෙන් දුවනව. ඉතා හොඳින් සොබාදහම රසවිඳිනව. ගිය ආත්මෙ පරිසරවේදියෙක් වෙන්න ඇති.



අල්ලපු වත්තට රිංගන්න පුළුවන් තැනක් හොයනව. ඉත්තැවො රිංගපු තැන් වලින් රිංගල යනව. ( cctv කැමරාවක සටහන් වූ දර්ශණයක්)

අල්ලපු වත්තේ ගෙදර (මිනින්දෝරු මහත්තය) කුඩා ළමයි දෙන්නෙක් සිටින නිසා එහි යාමට බොහෝ පිය කරයි. ළමයි සමග සෙල්ලම් කිරීමට ඉතා ප්‍රිය කරයි. එහි ගියවිට ආපසු ගෙන්වා ගැණීම ඉතා අපහසුයි, නමුත් ඒ සඳහා එක් ක්‍රමයක් තියනව. ඒ, ගේට්ටුවෙ බෙල් එක නාද කිරීමයි. එහි ශබ්දය ශ්‍රවනය වූ වහාම දුවගෙන පැමිණ ගේට්ටුව ළඟට ගොස් ආවෙ කවුද කියල සොයා බලයි.

**<u>ළමයි සමග සෙල්ලම් කිරීම</u>**

සමහර දිනවල සවස් කාලයේ අපේ වත්තට යාව ඇති මාවතේ ළමයින් ක්‍රීඩා කරනවිට නූපි වත්ත ඇතුලේ සිට, ඔවුන්ගේ කෑගසන ශබ්දය අනුව එහා මෙහා දුවමින් සිටින අතර ඔවුන්ගෙ ටෙනිස් බෝලය අපේ වත්තට වැටුන විට එය කටින් ගෙන එහා මෙහා දුවයි. නමුත් ළමයෙක් තාප්පයෙන් පැන ආ විට, ටික වේලාවක් එහා මෙහා දුවමින් සිට පසුව බෝලය ඔහුට දෙයි.

## <u>ලේන් පැටියා</u>

2023 මැයි මාසයේ දිනක් දින කීපයක් වයසැති කුඩා ලේන් පැටියෙක් මිදුලේ බිම සිටියදී හමුවිය. චූටිදුව-තිලිනි, ඌව ආදරයෙන් ඇතිදැඩි කරන්නට විය. දිනකට පමණ පසු කිරි බීමට පටන් ගත් නමුත් මුලදී කිරි බින්දුවක් පමණ කටේ ගෑවූ විට එය බීවේය. දින කීපයකට පසු ඉදුන කෙසෙල් ගෙඩි කැබැල්ලක් යන්තමින් කෑවේය.







දින කීපයකට පසු මගේ හිතවතෙක් වූ ජාලියට ඌව දෙන ලදී. ඔහුට අවුරුදු එකක් සහ තුනක් පමණ වයසැති දරු දෙදෙනෙක් සිටින බැවින් ඔවුන්ද ඉතා ආදරයෙන් රැක බලාගන්නට විය.



ඉන් පසු සෑම දිනකම තිලිනි ලේන් පැටිය ගැන තොරතුරු විමසන්නට විය. සතියකට පමණ පසු අද 2023 මැයි 29 දින ලේන් පැටියව බලන්න යමු යයි තිලිනි කී විට ජාලියටද ඒ බව දන්වා හවස යාමට සූදානමින් සිටිනවිට දවල් ජාලියගෙන් ඇමතුමක් ලැබුනි. ලේන් පැටිය මැරුණ බව ඔහු කීවේය. ඒ බව චූටිදුවට කී පසු ඇය දවල්ට කන්නෙත් නැතිව පැය ගණනක් හඬමින් සිටියාය. ජාලියගේ දුව සයුරිද පැය ගණනක් හඬමින් සිටි බව දැන ගන්නට ලැබුනි.

## <u>සේවි (Savy)</u>

සති කීපයකට පෙර (2023 ජූනි 27 වැනිදා) සුනඛයෙක් වාහනයක ගැටීම නිසා වම් අත තුවාලවී පොඩිඅක්කගෙ මිදුලෙ වැතිර සිටින බවත්, නැගිටින්නට අපහසුව සිටින බවත් දැනගන්නට ලැබුනි. දින ගණනාවක්ම චූටිදුව සහ මම ඌට කෑම සහ වතුර ගෙනගොස් දී සාත්තු කළෙමු.

| | | |
|---|---|---|
| WhatsApp Video 2023-06-27 at 17.40. | WhatsApp Video 2023-06-28 at 07.03. | WhatsApp Video 2023-06-29 at 13.37. |

පසුව යන්තමින් ඇවිදින්න පුළුවන් වූවිට, අපේ ගෙදරට හැරෙන තැන පාර අයිනේ සිටිනු දක්නට ලැබුන අතර දිනපතාම අප ආහාර සැපයූවෙමු. අදට දින දෙකකට පෙර රාත්‍රියේ පුතා-ගෞරික ගෙදරට ඒම සඳහා කාර්එක හරවනවිට ඌ පාර අයිනේ සිටි බව නොදුටු බැවින් උගේ කකුලක් රෝදයට යටවී ඇත. වහාම ඌව කාර්එකේ දමාගෙන පශුවෛද්‍ය වරයෙක් හමුවී ප්‍රතිකාර ගෙන අපේ වත්තට ගෙන එන

ලදී. අපගේ නිවසතුල නූපි සිටින බැවින් ඌව මිදුලේ තැබීය. අද පශුවෛද්‍ය රෝහලකට (නාරාහේන්පිට Pet V care animal hospital) ගෙනගොස් ශල්‍යකර්මයක් කිරීමෙන් පසුව නැවත ගෙනැවිත් නිවස පිටුපස සිටීමට සැලැස්වීය. අපගේ නූපිද ඌව සාදරයෙන් පිළිගන්නා ලදී. චූටි දුව විසින් ඌට "සේවී" ලෙස නම්තැබීය.



ඉහත දැක්වෙන්නේ ශල්‍යකර්මයට පසුව ගත් එක්ස්-කිරණ ඡායාරූපයයි. එහි දකුණු කකුලේ දනහිස සහ උකුල් ඇටය අතර තිබෙන අස්ථිය කැබලි කීපයකට කැඩී ඇති නිසා stainless steel කම්බි දෙකක් තබා, තවත් කම්බි දෙකකින් ගැටගසා ඇත. (පසුව ඒ කම්බි දෙක ඉවත් කරනු ලැබේ)